# ඔබගේ සහකරුවා හෝ සහකාරිය සමඟ පරලොව දී එක් ව විසීමට කැමති ද

## දුතිය සමජීවි සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 2 - පිටු අංක 118 - 119)

අඹු සැමි දෙදෙනා මෙලොව දී මෙන් ම පරලොව දී ත් ඔවුනොවුන් දක්නට කැමති නම් දෙදෙනා ම සමාන ශ්‍රද්ධාවෙන්, සමාන සීලයෙන්, සමාන පරිත්‍යාගයෙන්, සමාන ප්‍රඥාවෙන් සමන්විත විය යුතුය.

එසේ වූ විට ඔවුන් දෙදෙනා මෙලොව දී මෙන් ම පරලොව දී ද ඔවුනොවුන් දකිති.